ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# ඇබෑර්තු

## පරිපාලන කාර්ය මණ්ඩලය

### අභ්‍යන්තර විගණක තනතුර

### සුදුසුකම් සහ බඳවා ගැනීමේ පරිපාටිය

1. (අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) හෝ ඒ හා සමාන ආයතනයක සාමාජිකත්වය දැරිය යුතුය;

සහ

(ආ) ඉහත 1 (අ) හි සුදුසුකම ලැබීමෙන් අනතුරුව අවම වශයෙන් වසර හයක (06) ගණකාධිකරණය සහ / හෝ විගණනය පිළිබඳව විධායක මට්ටමේ පළපුරුද්දක් ලබා තිබිය යුතු වීම.

හෝ

2. පහත සඳහන් සුදුසුකම් සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක / ආයතනයක නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය මූල්‍යාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක තනතුර දරන්නකු වීම;

- එම තනතුරෙහි ස්ථිර කර තිබීම සමඟ එම තනතුරෙහි වසර තුනක (03) සතුටුදායක සේවා කාලයක් තිබීම; එයින් එක් වසරක් (01) ඉහත 1 (අ) සුදුසුකම ලබා ගැනීමෙන් පසුව විය යුතුය.

හෝ

3. පහත සඳහන් සියලුම සුදුසුකම් සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක / ආයතනයක ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක තනතුර දරන්නකු වීම;

- එම තනතුරෙහි ස්ථිර කර තිබීම සමඟ ගණකාධිකරණය සහ / හෝ විගණනය පිළිබඳව විධායක මට්ටමක වසර දහයක (10) පළපුරුද්ද;
- ඉහත වසර දහයක (10) සේවා කාලයෙන් අවම වශයෙන් වසර අටක (08) සතුටුදායක සේවයක් විශ්වවිද්‍යාල පද්ධතියේ ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක තනතුරේ සේවය කර තිබිය යුතුය;
- ඉහත වසර අටක (08) පළපුරුද්දෙන් වසර තුනක් (03) ඉහත 1(අ) සුදුසුකම ලබා ගැනීමෙන් පසුව විය යුතුය.

හෝ

4. පහත සඳහන් සියලුම සුදුසුකම් සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / ආයතනයක නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය මූල්‍යාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක තනතුර දරන්නකු වීම;

- එම තනතුරෙහි ස්ථිර කර තිබීම;
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) අන්තර්මධ්‍ය සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම;
- පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් ගණකාධිකරණය / මූල්‍ය / කළමනාකරණය* පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම;
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) අන්තර්මධ්‍යම සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ගණකාධිකරණය සහ / හෝ විගණනය පිළිබඳව විධායක මට්ටමක වසර දොළහක (12) පළපුරුද්ද.

- ඉහත පළපුරුද්දෙන් වසර දහයක් (10) විශ්වවිද්‍යාල පද්ධතියේ ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක තනතුරේ සේවය කර තිබිය යුතුය.

හෝ

5. පහත සඳහන් සියලුම සුදුසුකම් සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / ආයතනයක නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය මූල්‍යාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක තනතුර දරන්නකු වීම;

- එම තනතුරෙහි ස්ථිර කර තිබීම සමඟ එම තනතුරෙහි වසර තුනක (03) සතුටුදායක සේවා කාලයක් තිබීම;

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් ප්‍රථම උපාධියක් ලබා ගෙන තිබීම;

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) අන්තර්මධ්‍යම සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම.

හෝ

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) හෝ එහි පූර්වගාමී ආයතනය විසින් පවත්වන ලද ගණකාධිකරණය පිළිබඳ උසස් තාක්ෂණ ඩිප්ලෝමාව (HNDA);

- ඉහත සඳහන් කරන ලද අන්තර්මධ්‍යම සුදුසුකම / ගණකාධිකරණය පිළිබඳ උසස් තාක්ෂණ ඩිප්ලෝමාව (HNDA) ලබා ගැනීමෙන් අනතුරුව ගණකාධිකරණය සහ / හෝ විගණනය පිළිබඳව විධායක මට්ටමක වසර දාහතරක (14) පළපුරුද්ද;

- ඉහත පළපුරුද්දෙන් අවම වශයෙන් වසර පහක් (05) U-EX 2 (I) වැටුප් කේතය මඟින් දක්වන වැටුප් පරිමාණය දරන විශ්වවිද්‍යාල පද්ධතියේ නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය මූල්‍යාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක සහ / හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක තනතුර දරන්නකු විය යුතුය.

හෝ

6. පහත සඳහන් සියලුම සුදුසුකම් සමග විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / ආයතනයක නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය මූල්‍යාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක තනතුර දරන්නකු වීම;

- එම තනතුරෙහි ස්ථිර කර තිබීම;

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් ලබා ගත් ප්‍රථම උපාධිය.

හෝ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) අන්තර්මධ්‍යම සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම.

හෝ

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) හෝ එහි පූර්වගාමී ආයතනය විසින් පවත්වන ලද ගණකාධිකරණය පිළිබඳ උසස් තාක්ෂණ ඩිප්ලෝමාව (HNDA);

- විශ්වවිද්‍යාල පද්ධතියේ ගණකාධිකරණය සහ / හෝ විගණනය පිළිබඳ වසර දහඅටකට (18) නොඅඩු පළපුරුද්දක් තිබීම.

- ඉහත පළපුරුද්දෙන් වසර තුනක් (03) විශ්වවිද්‍යාල පද්ධතියේ නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය මූල්‍යාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක තනතුර දරන්නකු විය යුතු ය.

හෝ

7. පහත සඳහන් සියලුම සුදුසුකම් සමඟ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ ගණකාධිකාරී II ශ්‍රේණියේ තනතුරක් දැරීම;

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) හෝ ඒ හා සමාන ආයතනයක සාමාජිකත්වය දැරිය යුතුය;

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් ගණකාධිකරණය / මූල්‍ය / කළමනාකරණය* පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**සටහන : 'ගණකාධිකරණ සහ / හෝ විගණන'** පළපුරුද්ද යනු රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ගණකාධිකරණ සහ / හෝ විගණනයේ විධායක මට්ටමක ලබා ගත් පළපුරුද්දයි.

* **'කළමණාකරණය'** යන යෙදුමෙන් අර්ථ දැක්වෙනුයේ ගණකාධිකරණය සහ මූල්‍ය ප්‍රධාන සංරචක සමඟ කළමනාකරණය / රාජ්‍ය පරිපාලනය / ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියකි.

## වැටුප් පරිමාණය

1. අභ්‍යන්තර විගණක තනතුර :- U-EX 3 (II) Rs. 95,320 – 7x2,170; 11x2,700 – 140,210 p.m. + (රු. 12,800 ජීවන වියදම් දීමනාව + රු. 5,000 මාසික දීමනාව + 45% අනධ්‍යයන දීමනාව + 20% අමතර දීමනාව සහ වෙනත් අනුමත දීමනා)

## බඳවා ගැනීමේ ක්‍රමවේදය

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගැනීම සිදු කෙරේ.